# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව -සබරගමුව

## සති පාසල

**විෂය-පෙරදිග සංගීතය**

**ජුනි මාසය**

**ශ්‍රේණිය-9**

**1 - සතිය**

1.පාඩම හෝ ඒකකය- **විවිධ ස්වර ස්ථාන ශ්‍රැති කර ගනිමින් ස්වර පුවරුවෙන් ගීත වාදනය.**

2.නිපුණතාවය 2.0 - වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

3.නිපුණතා මට්ටම 2.1 - වාදනයේ මූලික කරයි හැකියා වර්ධනය කර ගනියි.

.

4.පෙර ඉගෙනුම් අවස්ථා/ශිෂ්‍යා කළ යුතු කාර්යයන් :

- ❖ පහත දැක්වෙන වගු අධ්‍යයනය කිරීම මඟින් ශ්‍රැති මාරු කර ලිවීම සහ වාදනය සිදු කරන අයුරු ඉගෙන ගැනීමට උත්සාහ කරමු.

කියවීම් පත්‍රිකාව

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
| ස්වර 12 පිහිටීම → | ස | රි̲ | රි | ග̲ | ග | ම | මˊ | ප | ධ | ධ | නි̲ | නි | ස |
| ෂඩ්ජභාවයෙන් අෂ්ටකය→ | ස | | රි | | ග | ම | | ප | | ධ | | නි | ස් |
| | 1 | | 2 | | 3 | 4 | | 5 | | 6 | | 7 | 8 |

- ➢ දෙවන තීරුවේ තිබෙනුයේ ඔබ පෙර උගත් ස්වර 12 පිහිටීමයි.
- ➢ තෙවන තීරුවේ තිබෙනුයේ සඩ්ජයෙන් පටන් ගත් විට ස්වර අෂ්ටකයයි.එය C Major Scale ලෙස නැතහොත් (ස)සඩ්ජය ශ්‍රැති කරගෙන බිහිවූ ස්වර අෂ්ටකයයි.
- ➢ සිව්වන තීරුවෙන් දැක්වෙන්නේ Major Scale එකක දී ලැබෙන ස්වර අන්තරයන්ය.එහිදී තුන් වන , හතර වන ,ස්වර අතර හා හත්වන හා අටවන යන ස්වර අතර පරතරයක් නැත.
- ➢ මෙම ස්වර පිහිටීම ඕනෑම ස්වරයක් ශ්‍රැති කරගෙන Major Scale යක් ලිවීමේ දී සිදුවන ස්වර අන්තරයන්ය.

- ➢ මෙය තව දුරටත් පැහැදිලි කර ගැනීමට දැන් අපි F Major Scale ගොඩ නැගෙන ආකාරයද එම ස්වර අන්තරයන්ම බව අවබෝධ කර ගනිමු.

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මධ්‍යම භාවය | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 | 2 | 3 | 4 | 5 | 6 |
| F Major Scale | ම | මˊ | ප | ධ | ධ | නි̲ | නි | ස | රි̲ | රි | ග̲ | ග | ම |
| 1 සිට 8 තෙක් | ම | | ප | | ධ | නි̲ | | ස් | | රි | | ග | ම |
| අංක යෙදූ ස්වර | 1 | | 2 | | 3 | 4 | | 5 | | 6 | | 7 | 8 |

❖ එසේම G Major Scale ගොඩ නැගෙන්නේ ත් එම ස්වර අන්තර අනුවමය.මේ අනුව ඔබට Major Scale ගොඩ නැගෙන අයුරු අවබෝධ වන්නට ඇති.

ඔබ 9 ශ්‍රේණියේ දෙවන වාරයට නියමිත විවිධ ස්වර ස්ථාන ශ්‍රැති කර ගනිමින් ස්වර පුවරුවෙන් ගීත වාදනය සර්පිනාවේ ව්‍යුහය විවිධත්වය හා යාන්ත්‍රණය පිළිබඳ ඉතා පැහැදිලිව ඉගෙන ගැනීමට පහත සඳහන් පොත්පත්,Web Site , LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක පහත link ඔස්සේ නරඹන්න.සර්පිනාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ අවබෝධය ලබා ගන්න.

- e-තක්සලාව : -
- e-නැණපියස : -
- Youtube :

1.https://youtu.be/2w1-_--1tTA?list=PLQX7SVzJRMEykqp1u1-SvbkxIRW-DAsER
ශ්‍රැති මාරු කර ලිවීම-සංජය වසන්ත මහතා-නිවිතිගල අධ්‍යාපන කලාපය
ර/නිවි/අයගම ශ්‍රී රාහුල ම.වි.

2.https://youtu.be/PJEigc1GEUo - නිලංග වාසල මහතා

❖ එසේ තාක්ෂණය ඔස්සේ නැරඹිය නොහැකි දරුවන් සඳහා ඉහත සඳහන් කියවීම් පත්‍රිකාව තුළ ඇතුළත් කරුණු ආධාරයෙන් මෙම පාඩම අවබෝධ කර ගන්න.ඒ සඳහා පාසලේ සංගීත විෂය භාර ගුරු මහතා ගේ මහත්මිය ගේ සහාය ලබා ගන්න.

❖ අතිරේක පොත්/සඟරා :

1.අතිරේක කියවීම් පොත- පෙරදිග සංගීතය-9 ශ්‍රේණිය
2.සංගීත අධ්‍යයනය-ගුණපාල විතානගේ මහතා
3. පෙරදිග සංගීතය-9 ශ්‍රේණිය- ජානක බණ්ඩාර ජයලත් මහතා

5.මෙම සතිය තුළ නියමිත පාඩම්වලින් ලබා ගත යුතු ඉගෙනුම් ඵල :

- ම හා ප ශ්‍රැති කර ගත් විට ලැබෙන ස්වර අෂ්ටකය නම් කරයි.
- ම හා ප ශ්‍රැති කර ගනිමින් වාදනය කිරීම සඳහා විශේෂයෙන් අභ්‍යාස කළ යුතු බව දැන ගනියි.
- ම හා ප ශ්‍රැති කර ගනිමින් බිලාවල් හා කාෆි යන රාගයනට අයත් ආරෝහණ අවරෝහණ හා ගීත වාදනය කරයි..

6.ඇගයීම්/තක්සේරුකරණ ක්‍රමවේද හා ආකෘති :

❖ ඔබ නැරඹූ ශ්‍රැති මාරු කර ලිවීමේ vedio පාඩම් ඇසුරින් හෝ එසේ තාක්ෂණය ඔස්සේ නැරඹිය නොහැකි දරුවන් සඳහා ඉහත සඳහන් කියවීම් පත්‍රිකාව ආධාරයෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න. ඔබේ පාසලේ සංගීත ගුරුතමා/තුමියට පෙන්වා පිළිතුරු නිවැරදි දැ,යි තහවුරු කර ගන්න.

1.පහත සඳහන් G Major Scale යට අයත් ස්වර අන්තරයන් ගැන සැලකිලිමත් වෙමින් ලියා දක්වන්න.

| පංචම භාවය | 8 | 9 | 10 | 11 | 12 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| G Major Scale | ප | ධ̲ | ධ | නි̲ | නි | ස̇ | රි̲̇ | රි̇ | ග̲̇ | ග̇ | ම̇ | ම̇´ | ප̇ |
| 1 සිට 8 තෙක් | | | | | | | | | | | | | |
| අංක යෙදූ ස්වර | 1 | | 2 | | 3 | 4 | | 5 | | 6 | | 7 | 8 |

2.දැන් ඔබ ස්වර වාද්‍ය භාණ්ඩයකින් C Major Scale , F Major Scale , G Major Scale වලට අයත් ස්වර අෂ්ටකය වාදනය කර බලන්න.

3.පහත දැක්වෙන සඩ්ජ භාවයෙන් ලියා ඇති ස්වර ඛණ්ඩ මධ්‍යම භාවයෙන් සහ පංචම භාවයෙන් ලියා දක්වන්න.

ග - ම /ප - ග /ම - ග /රි - -

ග - ම /ප - ධ /නි - - /- - -

ධ - නි /ස̇ -ධ /ප - මුග /රි - -

ප - රි /ග - රි /ස - -/- - -

4.දැන් ඔබ එසේ මධ්‍යම භාවයෙන් සහ පංචම භාවයෙන් ලියූ ස්වර ප්‍රස්තාර කොටස් වාදනය කරන්න.

6.පහත දැක්වෙන බිලාවල් සහ කාෆි රාගයට අයත් ආරෝහණ ස්වර මධ්‍යම භාවයෙන් සහ පංචම භාවයෙන් ලියන්න.

බිලාවල්

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
| ස | රි̲ | රි | ග̲ | ග | ම | ම´ | ප | ධ̲ | ධ | නි̲ | නි | ස |
| ස | | රි | | ග | ම | | ප | | ධ | | නි | ස̇ |
| 1 | | 2 | | 3 | 4 | | 5 | | 6 | | 7 | 8 |

කාෆි

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
| ස | රි̲ | රි | ග̲ | ග | ම | ම´ | ප | ධ̲ | ධ | නි̲ | නි | ස̇ |
| ස | | රි | ග̲ | | ම | | ප | | ධ | නි̲ | | ස̇ |
| 1 | | 2 | 3 | | 4 | | 5 | | 6 | 7 | | 8 |

5.ඔබ කැමති ගීතයක් හෝ ගීත කිහිපයක් තෝරා ගෙන ඒවායේ  ස්වර ප්‍රස්තාර මධ්‍යම භාවයෙන් සහ පංචම භාවයෙන් වාදනය කිරීමට උත්සාහ කරන්න.

6. ඔබේ පාසලේ සංගීත ගුරුතමා/තුමියට පෙන්වා හෝ vedio/Whatsapp කර යවා පිළිතුරු නිවැරදි දැ,යි තහවුරු කර ගන්න.

පාඩම සැකසුම : නිවිතිගල අධ්‍යාපන කලාපය

සෞන්දර්ය  අංශය